# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

අංක 14,934/5 — 1970 දෙසැම්බර් 3 වැනි බ්‍රහස්පතින්ද — 1970.12.3

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)


# IV වැනි කොටස – පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)

## පළාත් පාලන නිවේදන

ඇල්. ඩී.—බී. 31/47

### ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනත

#### 84 වැනි වගන්තිය යටතේ ආඥව

(262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනතේ 84 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමති, ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම මෙම ආඥවෙන්, 1970 දෙසැම්බර් 31 වැනිදාට පෙර පැවැත්වීමට නියමිතව ඇති, ගාල්ල දිස්ත්‍රික්කයේ, මාදම්පේ ගම් සභාවේ මහා ඡන්ද විමසීම සම්බන්ධයෙන් එහි අංක 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10, 11, 12, 13, 14 සහ 15 දරන කොට්ඨාශවල අපෙක්ෂකයන්ගේ නාම යෝජනා කාර්‍යයන් සඳහා ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනතේ 26 වැනි වගන්තිය යටතේ මෙතෙක් ගනු ලැබූ සෑම ක්‍රියාවක්ම අවලංගු සහ බලරහිත විය යුතුවාක් මෙන් ම සෑම විටම, එසේ අවලංගු සහ බල රහිත වී ඇති ලෙස සැළකිය යුතු බව ද ප්‍රකාශ කරමි.

ෆී. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමති.

1970 නොවැම්බර් මස 30 වෙනි දින,
කොළඹ දී ය.

12–325/1

---

ඇල්. ඩී.—බී. 31/47

### ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥපනත

(262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥපනතේ 13 වැනි සහ 84 වැනි වගන්තිවලින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥවයි.

ෆී. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමති.

1970.11.30 වැනිද
කොළඹ දීය.

#### ආඥව

1. 1971 පෙබරවාරි මස 28 වැනි දින හෝ ඊට පෙර පැවැත්වීමට නියමිතව ඇති කෝට්ටේ නගර සභාවේ සභිකවරුන් තේරීමේ මහා ඡන්ද විමසීමේ කාර්යය සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ මැතිවරණ නිලධාරියා විසින්, එකී ඡන්ද විමසීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥ පනතේ 26 වැනි සහ 38 වැනි වගන්තිවලින් නියම කරනු ලබන කටයුතු ඔහුගේ අභිමතය පරිදි ක්‍රියා කරමින්, ඉහත කී නගර සභාවේ සභිකවරුන්ගේ තනතුරු කාලය ආරම්භ වීමට නියමිත දිනය ගැන සැලකිලිමත්ව, ඔහු විසින් තීරණය කරනු ලැබිය හැකි දිනයන්හිදී කළ යුතුය.

2. (262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥපනතෙහි කුමක් සඳහන් වුවද, ඉහතකී ඡන්ද විමසීමේ කාර්යයන් සඳහා ඡන්ද ලැයිස්තු සකස් කිරීමක් නො කළ යුතු අතර එකී මහා ඡන්ද විමසීමේ කාර්යයන් සඳහා භාවිතා කළ යුතු ඡන්ද ලැයිස්තු කොළඹ දිස්ත්‍රික්කයේ මැතිවරණ නිලධරයා විසින් 1970 ජූලි මස 19 වැනි දින සහතික කරනු ලැබූ ඡන්ද ලැයිස්තු විය යුතුය.

12–325/2

914/1 —— ජේ 18759—5,750 (70/11)

ඇල්. ඩී.—බී. 31/47.

## ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත

(262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 13 වැනි සහ 84 වැනි වගන්තිවලින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමති.

1970.11.30 වැනි ද, කොළඹ දී ය.

### ආඥාව

1. 1971 මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර පැවැත්වීමට නියමිතව ඇති ධර්ගා නගරය සුළු නගර සභාවේ සභිකවරුන් තේරීමේ මහා ඡන්ද විමසීමේ කාර්යය සඳහා කළුතර දිස්ත්‍රික්කයේ මැතිවරණ නිලධරයා විසින්, එකී ඡන්ද විමසීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 26 වැනි සහ 38 වැනි වගන්තිවලින් නියම කරනු ලබන කටයුතු ඔහුගේ අභිමතය පරිදි ක්‍රියා කරමින්, ඉහත කී සුළු නගර සභාවේ සභිකවරුන්ගේ තනතුරු කාලය ආරම්භ වීමට නියමිත දිනය ගැන සැලකිලිමත්ව, ඔහු විසින් තීරණය කරනු ලැබිය හැකි දිනයන්හි දී කළ යුතුය.

2. (262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥා පනතෙහි කුමක් සඳහන් වුවද, ඉහත කී මහා ඡන්ද විමසීමේ කාර්යයන් සඳහා ඡන්ද ලැයිස්තු සකස් කිරීමක් නොකළ යුතු අතර එකී මහා ඡන්ද විමසීමේ කාර්යයන් සඳහා භාවිතා කළ යුතු ඡන්ද ලැයිස්තු කළුතර දිස්ත්‍රික්කයේ මැතිවරණ නිලධරයා විසින් 1970 ජූලි මස 21 වැනි දින සහතික කරනු ලැබූ ඡන්ද ලැයිස්තු විය යුතුය.

12—325/3

---

ඇල්. ඩී.—බී. 31/47.

## ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත

### 84 වැනි වගන්තිය යටතේ ආඥාව

(262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 84 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාව.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමති.

1970.11.30 වැනිද, කොළඹ දී ය.

### ආඥාව

(262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතෙහි පටහැනිව කුමක් සඳහන් වුවද—

(අ) මෙහි වූ උපලේඛනයෙහි I වැනි තීරයේ නිශ්චිත ලෙස සඳහන් කර ඇති එක් එක් ඡන්ද ප්‍රදේශය පිහිටි දිස්ත්‍රික්කවල මැතිවරණ නිලධාරියා විසින්, මෙහි වූ උප ලේඛනයේ II වැනි තීරයේ නිශ්චිත ලෙස සඳහන් කර ඇති එක්එක් කොට්ඨාශය සඳහා සභිකයකු ඡන්දයෙන් තෝරා පත් කර ගැනීමේ කාර්යය පිණිස ඡන්දය විමසීමේ දිනය හැටියට, 1970 දෙසැම්බර් 4 වැනි ද නියම කරමින්, ඉහත කී ආඥාපනතේ 38 සහ 41 වැනි වගන්ති යටතේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම් අවලංගු සහ බලරහිත විය යුතුවාක් මෙන්ම සෑම විටම එසේ අවලංගු සහ බල රහිත වී ඇතැයි සැලකිය යුතුය.

(ආ) එකී ඡන්ද ප්‍රදේශය පිහිටි දිස්ත්‍රික්කයේ මැතිවරණ නිලධාරියා විසින් එකී එක් එක් කොට්ඨාශය සම්බන්ධයෙන් ඡන්දයක් විමසීමේ කාර්යය සඳහා නිශ්චිත ලෙස වෙනත් දිනයක් නියම කරමින්, එකී වගන්ති යටතේ අළුත් දැන්වීමක් ප්‍රසිද්ධ කළ යුතුය.

### උපලේඛනය

| I වැනි තීරය<br>ගම් ප්‍රදේශය | II වැනි තීරය<br>කොට්ඨාශ |
|---|---|
| ඔයබොඩ පේරුව ... ... | ... අංක 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10, 11, 12, 13, 14, 15, 16 සහ 17 |
| මාරපන ... ... | ... අංක 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10, 11, 12, 13, 14, 15, 16, 17 සහ 18. |

12—325/4

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණයකි.